# පළාත් පාලන දෙපාර්තමේන්තුව
# උතුරු පළාත

## <u>ප්‍රසම්පාදන දැන්වීම</u>

## පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය සහ උපමාන පාදක ප්‍රදානය යන ව්‍යාපෘතීන් සඳහා මිල ගණන් කැඳවීම.

## (PSDG & CBG) - 2018

දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් උතුරු පළාතේ, පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා පහත උපලේඛනයෙහි සඳහන් අයිතම්වලට සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1. ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුව ලංසු කැඳවනු ලැබේ. එනමුත්, උතුරු පළාතේ බල ප්‍රදේශය තුළ ලියාපදිංචි කළ ලංසුකරුවන්ට පමණක් සීමිත කර ඇත.

2. ලංසුකරුවන්, ඉදිකිරීම් ක්ෂේත්‍ර සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී තිබීමත් සමග මාර්ග පුනරුත්ථාපනය සහ ගොඩනැගිලි කාර්යයන්වලට සුදුසු පහත උපලේඛනයෙහි දැක්වෙන ප්‍රමිතිවලින් පමණක් යුත්, කළු පටියට නම ඇතුළත් නොවූ තැනැත්තෙකුව සිටිය යුතුය. සුදුසුකම්ලත් ලංසු නොලැබෙන අවස්ථාවක, පහත දැක්වෙන උපලේඛනයෙහි වූ CIDA ප්‍රමිතියට ඉහළින්වන ලංසුකරුවන්ගේ ලංසු කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම් පිළිබඳ වූ අවශ්‍යතාවයන් ලංසු ලියකියවිල්ලෙහි V වැනි කොටසට **(Schedule / Bidding Data & Contract Data)** ඇතුළත් කර ඇත.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසු ලංසුකරුවන්හට යාපනය, කයිතඩි, යාපනය - නුවර පාරේ, වැඩිහිටි නිවාස සංකීර්ණයේ පිහිටි උතුරු පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙතින් **දුරකථන අංකය:021-2213728 හෝ ෆැක්ස් අංකය:021-2215738 හෝ විද්‍යුත් තැපැල:nplocalplan@gmail.com** හෝ මගින් වැඩිමනත් තොරතුරු ලබාගත හැකිය.

5. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් **යාපනය, කයිතඩි, A-9 පාරේ, වැඩිහිටි නිවාස සංකීර්ණයේ පිහිටි උතුරු පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව** වෙතින් **2018.05.04** වැනි දින සිට **2018.05.25** වැනි දින දක්වා පෙරවරු පැය 09.00 සිට පස්වරු පැය 14.00 දක්වාවන කාලය තුළ දී ආපසු නොගෙවන ගාස්තුව වශයෙන් එක් ලංසු ලේඛන කට්ටලයකට රුපියල් 2,000.00ක් බැගින් මුදල් ගෙවා ලබාගත හැකිය.

6. **මිල ගණන් පිටපත් දෙකකින් යුතුව (මුල් පිටපත හා අනු පිටපත) 2018.05.25** වැනි දින පස්වරු පැය **14.00**ට හෝ ඊට පෙරාතුව ලැබීමට හැකිවන සේ සභාපති, **දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව, පළාත් පාලන දෙපාර්තමේන්තුව, උතුරු පළාත, වැඩිහිටි නිවාස සංකීර්ණය, A-9 පාර, කයිතඩි, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කාර්යාලයේ තිබෙන ප්‍රසම්පාදන පෙට්ටිය තුළට සෘජුවම බහාලීම හෝ කළ යුතුය. සියළුම ලංසු, ලංසු භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. මේ සඳහා ලංසුකරු හෝ ඔහු විසින් ලිඛිතව බලය ලබාදුන් නියෝජිතයෙකු හෝ සහභාගිවීමට අනුමත කරනු ලැබේ.

7. ලංසු සම්බන්ධිත ප්‍රථම රැස්වීම යාපනය, කයිතඩි, A-9 පාරේ, වැඩිහිටි නිවාස සංකීර්ණයේ පිහිටි උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ දී **2018.05.16** වැනි දින පස්වරු පැය **14.30**ට පවත්වනු ලැබේ.

8. ලංසු ඉදිරිපත් කිරීමට ලබා දී ඇති අවසන් දිනයේ සිට දවස් 77ක් (2018.08.10) දක්වා වලංගුවේ පවතී.

9. ලැබුණු ලංසු මුළුමනින් හෝ කොටස් වශයෙන් හෝ ප්‍රතික්ෂේප කිරීමට හා නැවත මිල ගණන් කැඳවීමට ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයාට බලය ඇත්තේය.

10. පහත උපලේඛනයේ සඳහන් පරිදි ලංසු ඇපකරය අමුණා තිබිය යුතුය.

| ලංසු හැඳින්වීමේ අංකය | අයිතම | ප්‍රසම්පාදන කමිටුව | ඇස්තමේන්තු මුදල (මිලියන) | ගිවිසුම් කාලය | අවශ්‍ය කරන ප්‍රමිතිය | ලංසුවේ ඇප විස්තර | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | මුදල (රුපියල්) | අවශ්‍යවන කාලය |
| **NP/08/MN/MWPS/PSDG/ W/2018/01** | විඩත්තල්තිවු අභ්‍යන්තර පාර පුනරුත්ථාපනය - 07 වැනි කොට්ඨාශය | දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව | 15.00 | මාස 3යි. | **C6** හා **C5** | 150,000 | 2018.09.07 |
| **NP/08/JF/VWPS/PSDG/ W/2018/02** | අරාලි දකුණ කාරයිප්පිට්ඩි පිල්ලයියාර් කෝවිල පාර. | දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව | 12.00 | මාස 3යි. | **C6** හා **C5** | 120,000 | 2018.09.07 |
| **NP/08/JF/HO/CBG/ W/2018/01** | කාර්යාලීය ශ්‍රවණාගාරය ඉදිකිරීම, පළාත් පාලන දෙපාර්තමේන්තුව, උතුරු පළාත | දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව | 5.00 | මාස 3යි. | **C8** | 50,000 | 2018.09.07 |

එම්.පැට්‍රික් ඩිරංසන්,
සභාපති,
දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව,
පළාත් පාලන දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.
2018.05.02 වැනි දින.